මාධ්‍ය නිවේදන අංක **08**

මැතිවරණ කොමිෂන් සභාව

**2021.03.08** දින රැස් වූ මැතිවරණ කොමිෂන් සභාව මතු දැක්වෙන තීරණ ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

- මේ දක්වා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙතින් පමණක් ඉටු කරනු ලැබූ ඡන්දහිමි නාම ලේඛන උපුටන නිකුත් කිරීමේ කාර්යය පොදු මහජනතාවගේ දෛනික කාර්යයන් වඩාත් පහසුකරලීම පිණිස සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් නිකුත් කිරීමට හැකිවන පරිදි කඩිනම් වැඩපිළිවෙලක් සම්පාදනය කිරීම.

- 2021 වර්ෂය සඳහා දේශපාලන පක්ෂයක් වශයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ ලියාපදිංචිය සඳහා අයදුම්පත්‍ර 38 ක් ලැබී ඇත. මෙම අයදුම්පත්‍ර 1981 අංක 01 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ විධිවිධාන අනුව ඉදිරිපත් කළ යුතු මූලික ලේඛන වාර්තා ආදිය ඇතුළත් වී තිබේ ද යන්න පරීක්ෂා කර සංක්ෂිප්ත ලේඛනයක් සකසා එම අවශ්‍යතා සම්පූර්ණ කර ඇති සංවිධාන පමණක් ඉදිරි සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමට තීරණය කිරීම සහ එමෙන්ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් ප්‍රතිපාදනවලට අනුකූලව එම සංවිධානවල ව්‍යවස්ථා අන්තර්ගතයන් පවතීද යන්න පරීක්ෂා කිරීම ආරම්භ කිරීම.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,

සරණ මාවත,

රාජගිරිය.

2021.03.08